# දින්නාගපාදයන් ප්‍රධාන මධ්‍යතන බෞද්ධ තාර්කික ගුරුකුලය ප්‍රත්‍යක්ෂය පිළිබඳ ගොඩනැංවූ මතය පිළිබඳ විමසීමක්

සංජීවනී රූපසිංහ[1]

## හැඳින්වීම

දින්නාගපාදයෝ සහ ධර්මකීර්තිපාදයෝ මධ්‍යතන බෞද්ධ තාර්කික ගුරු කුලයේ ප්‍රධාන ආචාර්යවරු දෙදෙනා වෙති. මොවුන් අයත්වන්නේ යෝගාචාර සම්ප්‍රදායට වන අතර විඥානවාදීන් ලෙස සැලකේ. මොවුන් විසින් එකම සත් පදාර්ථය වශයෙන් සලකන විඥානයද ක්ෂණිකය. ක්ෂණයක් පාසා නැසෙන සුළුය. නාර්ජුන චින්තනයේ සහ යෝගාචාර චින්තනයේ සම්මිශ්‍රණයක් ලෙස දින්නාග සිය දර්ශනය ඉදිරිපත් කරයි. නාගර්ජුන දර්ශනයේ එන ශූන්‍යතාවාදයත් එනම් කිසිදු වස්තුවකට ස්ව ලක්ෂණයක් නැත යන අදහසත් එසේම ලෝකය අපගේම මනසේ නිර්මිතයක්ය යන යෝගාචාර විඥානවාදී මතයත් දින්නාග කෙරෙහි බලපාන ප්‍රධාන බලවේග දෙක වේ. සංකල්ප ලෝකය, භාෂාමය ලෝකයක් වන අතර ඒ ලෝකයට සත් භාවයක් නැත යන අදහස ඉහත දර්ශන ද්වයටම පොදු වූවකි. දින්නාගපාදයන් ප්‍රධාන මධ්‍යතන බෞද්ධ තාර්කික ගුරුකුලය ප්‍රත්‍යක්ෂය පිළිබඳ ගොඩනැංවූ මතය පිළිබඳ විමසීමක් මෙමගින් සිදු කෙරේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ප්‍රාථමික හා ද්විතීයිතික ග්‍රන්ථ පරිශීලනය මගින් සිදු කෙරෙන අධ්‍යයනයකි.

## දත්ත

අපට දැනුම දෙන්නේ ප්‍රත්‍යක්ෂයෙන් බව දින්නාග කියයි. සංකල්ප මගින් ප්‍රකාශ කළ හැකි ලෝකය සංස්කරණයන් වන බවත් ඒවාට සත්භාවයක් නොමැති බවත් එසේම නියම සද්භාවය වචනවලට ගෝචර නොවන බවත් දින්නාග පවසයි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය කල්පනාවෙන් ඔබ්බෙහි ඇත. මෙම ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වචනවලින් ස්වාධීන වේ. මෙම ප්‍රත්‍යක්ෂය ප්‍රජානනීය වන අතර එය සංවේදනයට කිට්ටු දෙයකි. දුවන ළමයෙකු පාරේ ඇති වැලි, තණකොළ, බොරළු වෙන වෙනම ග්‍රහණය කරන්නේ නැත්තේ යම් සේද එසේම ප්‍රත්‍යක්ෂය වචනවලට සංකල්පවලට යොදා ගත නොහැක. එය දැනීමකි. එය ප්‍රත්‍යක්ෂයක් වන්නේ අලුත් දැනුමක් දෙනවානම් පමණකි. එනම්, නියම ප්‍රත්‍යක්ෂය වන්නේ පළමුවර ප්‍රත්‍යක්ෂ කරන දේ

[1] ආරාධිත කථිකාචාර්ය, දර්ශන අධ්‍යයනාංශය, කැළණිය විශ්ව විද්‍යාලය.

පමණි. දෙවන වර ඒ දේ ප්‍රත්‍යක්ෂ කිරීමෙන් නව දැනුමක් නොලැබෙන හෙයින් එය ප්‍රත්‍යක්ෂය නොවේ. දින්නාග ප්‍රත්‍යක්ෂයට ස්වලක්ෂණය යැයි කියයි. ප්‍රත්‍යක්ෂය පිළිබඳ තවත් නිගමනයක් නම් වැරදි ප්‍රත්‍යක්ෂය කියා දෙයක් නොමැති වීමයි. හරි, වැරදි පිළිබඳ අදහස් පැන නගින්නේ සංකල්පකරණයත් සමගය. ප්‍රත්‍යක්ෂය නිරපේක්ෂක වන අතර එය සම්පූර්ණයෙන්ම විශ්වාසදායකය. වැරදි ප්‍රත්‍යක්ෂය යනු වැරදි යෙදුමකි. දින්නාගගේ ප්‍රත්‍යක්ෂය පිළිබඳ අදහසට පාදක වන්නේ මුල් බුදුසමයේ සිටම පැමිණෙන අනිත්‍ය, අනාත්ම වැනි සංකල්පයන්ය. මේවායේ වර්ධනයක් ලෙස ක්ෂණවාදය දියුණු වේ. මෙම ක්ෂණවාදයේ ප්‍රතිඵලයක් ලෙස දින්නාගගේ ප්‍රත්‍යක්ෂය පිළිබඳ අදහස ගොඩ නැගෙයි. ක්ෂණවාදය සමග ගමන් ගන්නේ විපරිණාමයයි. එනම් ප්‍රවාහී තත්ත්වයයි. මෙම අනිත්‍යත්වය නම් ක්ෂණික බවයි. ක්ෂණය යනු ඉතා සුළු කාලයකි. විදුලියක් මෙනි. විදුලියක් ඇතිවී නැතිවන විට චිත්තක්ෂණ රාශියක් ඉපිද පැවතී නැසී යයි. සිත කෙතරම් ඉක්මණින් ඇති වෙමින් නැති වෙමින් පෙරළේද කියතහොත් ඒ සඳහා උපමාවක්වත් දක්විය නොහැකි බව බුදුන් වහන්සේ විසින් දක්වා ඇත.

බෞද්ධ දර්ශනයෙහි මූලික සිද්ධාන්තය වන අනිත්‍යවාදය හෙවත් ''සියල්ල අනිත්‍යය'' කියන ලද අභාවාත්මක අනිත්‍යවාදය පසු කාලයෙහි බෞද්ධ දාර්ශනිකයෝ ක්ෂණිකවාද නමින් භාවාත්මක කොට ගත්හ. ධර්මකීර්තිපාදයෝ එයම තවදුරටත් න්‍යායානුකූල කොට ''සත්තාමාත්‍රානුබන්ධිත්වාත්නානාශස්‍ය''යි කීහ. විනාශය හෙවත් නැතිවීම, ඇතිවීම් මාත්‍රය අනුව පවත්නා හෙයිනි යනු එහි අර්ථයයි. ක්‍රි.ව. 700 දී විසූ ධර්මකීර්ති පරම්පරාවේ දාර්ශනිකයෙකු වූ ඥාන ශ්‍රී ''යත් සත් තත් ක්ෂණිකම්'' එනම් යමක් විද්‍යමාන නම් එය ක්ෂණිකයැයි කීය. අනිත්‍යත්වය විග්‍රහ කරන ධර්මකීර්ති පාදයේ ''යදුත්පත්තිමත් තදනිත්‍යම්'' එනම් යමක් ඉපදීම් ස්වභාවය ඇත්තේ නම් එය අනිත්‍ය යැයි කීහ. එය ''සබ්බෙ සංඛාරා අනිච්චා'' යන බුද්ධ වචනය අනුව කියන ලද්දකි. අනිත්‍යත්වය තවදුරටත් විවරණය කරමින් ''යමක් ඉපදී නිරුද්ධ වේ නම් එය අනිත්‍යයි'' යි කීහ.

දින්නාගට අනුව මෙම මෙහොත තිත් මොහොතකි. එය ක්ෂණයකි. සංවේදනයෙන් අපට ලැබෙන දෙය අපේ ක්‍රියාකාරීත්වයෙන් තොරව සිදුවන අක්‍රිය ප්‍රතීකයක් ලෙස හැඳින්වේ. එය එක්වරම දැනෙන දෙයකි. අපගේ ක්‍රියාකාරීත්වයක් එහි නැත. එය සංකල්පවලින් ප්‍රකාශ කරනවිට එය සිදුවන්නේ අපේ සහභාගීත්වයෙනි. එම නිසා එය ආරෝපිත දෙයකි. ක්‍රියාකාරීත්වය ඇති දෙය ප්‍රවාහී වෙයි. මොහොතක් මොහොතක් පාසා වෙනස් වෙයි. මේ අනුව සෑම සද්භාවයක්ම ශක්තීන්ගේ සැනෙලි වෙයි.

කාලයම හා අවකාශමය මොහොතක් තිත් මොහොතකි. කාලය, අවකාශය සද්භාවයම දේ නොවේ. මේ නිසා මෙම තිත් මොහොත ශක්ති පුංජයක් පමණකි. එය මොහොතකි. එය නැවත ඇති නොවේ. මෙහි ප්‍රවාහී තත්ත්වයක් තිබුණද චලිතයක්, ගමන් කිරීමක් නැත. තිතක් ඇතිවද්දීම එය නැති වේ. එම නිසා ගමන් කිරීමට කාලයක් නැත. එකකින් අනෙක ඇතිවෙනවා වැනි හේතුඵල සම්බන්ධයක් මෙහි නැත. හේතුව යැයි අපි ගන්නා දේ යම්කිසි තත්ත්වයක් ඇතිවන්නට පෙර

වූ අවසාන තිතයි. මුල් තිත ඇතිවී නැති වෙයි. එයට දෙවැනි තිතට බලපෑමක් කළ නොහැක. මෙහිදී හේතුව සහ ඵලය අතර සම්බන්ධයක් දැකිය නොහැක.

කමලශීල පවසන පරිදි ඊළඟ මොහොතේදී මුල් අංශුවේ කිසිම දෙයක් ඉතිරි වී නැත. සැනෙලි එළිය එහි නිවී ඇත. වේගයෙන් මේවා සිදුවන බැවින් ඒ අතර හේතුඵල සම්බන්ධයක් ඇති සේ පෙනී යයි. නියම සද්භාවයක් ඇත්තේ තිත් මොහොත තුළ පමණි. මෙම ක්‍ෂණවාදය, තිත් මොහොත්වාදය උඩ ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ අදහස ගොඩ නැගෙයි. දින්නාග දක්වන පරිදි ඥානය ලැබීමේ ප්‍රධාන මාර්ග 2කි. එනම්,

01. ප්‍රත්‍යක්‍ෂය
02. අනුමානය

ප්‍රත්‍යක්‍ෂය අපට දෙන්නේ සුවිශේෂ දේවල්ය. එය ක්‍ෂණික සංවේදනයකි. වැරදී යා නොහැක. අනුමානය යනු අප විසින් නිර්මාණය කරන ලද ලෝකය වේ. ප්‍රත්‍යක්‍ෂය සංකල්පවලින් තොර වන අතර සංකල්ප සහිත දෙය අනුමානයයි. ප්‍රත්‍යක්‍ෂය ඇසුරෙන්ද අනුමානය කළ හැක.

ධර්මකීර්ති පාදයෝ ප්‍රත්‍යක්‍ෂය හඳුන්වන්නේ ඇස් ආදී පංචේන්ද්‍රියන්ද රූප ආදී අරමුණුද මනසද එක්වීමෙන් ඇතිවන කල්පනාව හා සම්බන්ධ නොවූ භ්‍රාන්ති රහිත වූ ඥානය ලෙසය. මෙම ප්‍රත්‍යක්‍ෂය ඔහු විසින් කොටස් හතරකට බෙදා දක්වයි.

01. ඉන්ද්‍රිය ඥාන
02. මනෝ විඥාන
03. ස්ව සංවේදන
04. යෝගී ඥාන

මෙම ප්‍රත්‍යක්ෂය පිළිබඳ අදහස තවත් අතකින් බෞද්ධ හේතුඵල වාදයේම වර්ධනයකි. ක්‍ෂණයක් පාසා උපදිමින් නැසෙමින් පවත්නා මේ නාමරූප ධර්මයන්ගේ හේතු ප්‍රත්‍ය සම්බන්ධය පටිච්ච සමුප්පාදය ලෙස හැඳින්වේ. එක් ධර්මයක අභාවය අනෙක් ධර්මයක උත්පත්තියට ප්‍රත්‍ය වේ. එක් ධර්මයක උත්පත්ති ක්‍ෂණයට පූර්වක්‍ෂණය හැම කල්හිම අනෙක් ධර්මයකගේ නාශක්‍ෂණය වේ. එහෙයින් ප්‍රතීත්‍ය සමුප්පාදය අවිච්ඡින්න ප්‍රවාහයක් නොවේ. විච්ඡින්න ප්‍රවාහයකි. නිත්‍ය වූ කිසි වස්තුවක් නැතැයි තීරණය කරන ලද්දේ එහෙයිනි. අවිච්ඡින්නව පවත්නා යම් කිසිවක් ඇතොත් එයට නිත්‍ය යැයි කිව හැක. එහෙත් එබඳු නිත්‍ය වූ කිසිවක් නැත. ''සබ්බං භික්ඛවෙ අනිච්චං'' මහණෙනි, සියල්ල අනිත්‍යය යනුවෙන් බුදුන්වහන්සේ වදාරන්නේ එබැවිනි.

මෙම පටිච්චසමුප්පාදය අංග දොළසකින් යුක්තය. එනම් අවිජ්ජා, සංඛාරා, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ යනු ඒවායි. බුද්ධත්වය ලැබූ දිනයෙහිම තථාගතයන් වහන්සේ මෙම පටිච්ච සමුප්පාදය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් මෙනෙහි කළ සේක.

''අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං'' යනාදී වශයෙන් ඒ ඒ හේතුවෙන් ඒ ඒ ඵලයන් උපදනා ක්‍රමය අනුලෝම ක්‍රමයයි. ''අවිජ්ජා යත්වේව අසෙසවිරාගනිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා

විඤ්ඤාණනිරොධො" යනාදී වශයෙන් හේතු නිරෝධයෙන් ඵල නිරෝධය වන ක්‍රමය ප්‍රතිලෝම ක්‍රමයයි. පසුකාලීන බෞද්ධ දාර්ශනිකයෙකු වූ නාර්ජුනපාදයන් විසින් ස්වකීය මාධ්‍යමික දාර්ශනය සහ ශූන්‍යවාදය ගොඩනගන ලද්දේ මේ ප්‍රතීත්‍ය සමුප්පාදය පදනම් කොට ගෙනය. බෞද්ධ දර්ශනය තේරුම් ගැනීමේ යතුර වන්නේ මෙම ප්‍රතීත්‍ය සමුප්පාදයමය. ''යමෙක් ප්‍රතීත්‍යසමුත්පාදය දකින්නේද හෙතෙම ධර්මය දකින්නේය. මේ උපාදානස්කන්ධ පස ප්‍රතීත්‍ය සමුත්පන්නය'' යනුවෙන් බුදුන් වහන්සේ දේශනාකොට ඇත.

මෙම ප්‍රතීත්‍යසමුත්පාදයේ මුල් අංගය වශයෙන් අවිද්‍යාව දක්වන ලද නමුත් මෙම අවිද්‍යා මූලික ප්‍රතිත්‍යය සමුත්පාදය චක්‍රයක් මෙනි. චක්‍රයක මුල, මැද, අග දක්විය නොහැක. එය නොපෙනෙන නිසා නොව එබන්දක් එහි නොමැති නිසාය

**නිගමනය**

දින්නාගපාදයන් ප්‍රමුඛ මධ්‍යතන තාර්කික ගුරුකුලය විසින් ගොඩනගන ලද ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ අදහස වර්ධනය වන්නේ බෞද්ධ ක්‍ෂණවාදයේ සහ හේතුඵලවාදයේ ප්‍රතිඵලයක් ලෙසිනි. මෙහිදී ප්‍රත්‍යක්‍ෂය ඉතා ක්‍ෂණික වන අතර සංකල්පවලින් තොරය. මෙයට සෘජුවම බලපාන්නේ මුල් බුදුසමයේ සිට පැමිණෙන අනිත්‍ය අනාත්මවාද සමග සම්බන්ධව වර්ධනය වූ බෞද්ධ ක්‍ෂණවාදයයි. කාලය හෝ අවකාශය යැයි සත් පදාර්ථයන් නැති අතර ඇත්තේ ක්‍ෂණය පමණකි. එසේම බෞද්ධ හේතුඵලවාදය නාගර්ජුනපාදයන් විසින් තවදුරටත් වර්ධනය කරමින් ඵලය ඇතිවීමෙන් පසු අපට හේතුව දක්නට ලැබෙන බවද ඒවා එකිනෙකට සාපේක්‍ෂක බවද දක්වන ලදී. මෙහිදී ප්‍රත්‍යක්‍ෂය එක් ක්‍ෂණයක් පමණි. ඒවා අතර සම්බන්ධයක් නැත. ඒවා සිදුවීමේ වේගය මත ක්‍රියාකාරීත්වයන් සේ අපට පෙනේ. ප්‍රත්‍යක්‍ෂය පිළිබඳ මෙම අදහස බෞද්ධ හේතුඵල වාදයේම වර්ධනීය අවස්ථාවකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ධම්මරතන. නාරාවිල සහ පඤ්ඤාලෝක, හැඩිපන්නල. (1969). *භාරතීය දර්ශන*, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

රාධාකෘෂ්ණන්. (1970). *ඉන්දීය දර්ශනය* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ධර්මසිරි, ගුණපාල. (2007). *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* කර්තෘ ප්‍රකාශන.

Mookerjee, Satkari. (1935). *The Buddhist Philosophy of Universal Flux.* University of Culcutta.

Craig, Edward. (1998). *Rutledge Encyclopaedia of Philosophy.* London: Rutledge.